# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2026.09.08 පැය 1200 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 1483/2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**ශ්‍රවයාබාධිත ප්‍රජාවට WhatsApp හරහා 119 හදිසි ඇමතුම් අංශය වෙත පැමිණිලි ලබාදීමේ පහසුකම් සැලසීම.**

2026.09.03 දිනට යෙදී තිබූ 160 වන පොලිස් දිනයට සමගාමීව, ශ්‍රවයාබාධිත ප්‍රජාව සඳහා වන අයිතිවාසිකම් සුරැකීමේ සහ පහසුකම් පුළුල් කිරීමේ පියවරක් ලෙස, 119 හදිසි ඇමතුම් අංශය වෙත WhatsApp සමාජ ජාලය ඔස්සේ වීඩියෝ තාක්ෂණයෙන් පැමිණිලි ඉදිරිපත් කිරීමේ විශේෂ ව්‍යාපෘතියක් නිල වශයෙන් ගරු ජනාධිපතිතුමාගේ සුරතින් ආරම්භ කරන ලද අතර, 2026.09.10 වන දින සිට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු සූදානම් කර ඇත.

මෙමගින් ශ්‍රවයාබාධිත ප්‍රජාවට119 පොලිස් හදිසි ඇමතුම් අංශය සමඟ සම්බන්ධවී පැමිණිලි ඉදිරිපත් කිරීමට කෙටි දුරකථන අංකයක් හඳුන්වා දෙන තෙක් පහත දැක්වෙන පියවර අනුගමනය කරමින් තම පැමිණිල්ල ඉදිරිපත් කළ හැකිය.

පැමිණිල්ලක් ඉදිරිපත් කරන ආකාරය.

- පළමුව 011- 2809980 දුරකථන අංකය ඔබේ දුරකථනයේ Save කරගන්න.
- ඉන්පසුව WhatsApp හරහා එම අංකයට දුරකථන ඇමතුමක් (Audio Call) ලබා ගන්න.
- එවිට එම දුරකථන ඇමතුම විසන්ධි වී, ඔබේ දුරකථනය වෙත Link (සංකේතයක්) එකක් ලැබෙනු ඇත.
- එම Link එක හරහා නැවත WhatsApp වෙත පිවිසෙන්න.
- එහි ඇති "Join Browser" click කර "Join Meeting" වෙත පිවිසෙන්න.
- මෙම ක්‍රියාවලියෙන් පසුව වීඩියෝ ඇමතුම හා සම්බන්ධ වී පැමිණිල්ල ඉදිරිපත් කිරීමට පහසුකම් සැලසේ.

ශ්‍රවයාබාධිත ප්‍රජාවගේ ආරක්ෂාව සහ පහසුව වෙනුවෙන්ම ස්ථාපිත කරන ලද මෙම සුවිශේෂී සේවාව පිළිබඳව මහජනතාව දැනුවත් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

පොලිස් මාධ්‍ය කොට්ඨාසය.